# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## ஊவா மாகாண கல்வித் திணைக்களம்
## UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | ව්‍යවසායකත්ව අධ්‍යයනය - II | කාලය පැය 02යි. |
|---|---|---|

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

---

01. ඒ වර්ෂ 1980 අගභාගයයි අප කථානායකයා වන උපුල් ජීවත් වුයේ හාලිඇල බදුල්ල ප්‍රධාන පාර ආසන්නයේ පිහිටි ගමකය. පාසලේදී උසස් පෙළ සඳහා වාණිජ විෂය ධාරාවෙන් පෙනී සිටි උපුල් විශ්ව විද්‍යාල වරම් ලැබුවද විශ්ව විද්‍යාලයට ඇතුලත් වීමේ දෙගිඩියාවෙන් පසුවූයේ පවුලේ අගහිඟකම් නිසාවෙනි. පරිසරය පිළිබඳ නිරන්තර විමසිල්ලෙන් සිටීම පුරුද්දක් කරගෙන සිටි උපුල්ට තම නිවස ආශ්‍රිතව ස්වභාවික ජල උල්පත් රාශියක් පවතින බවත් ජලය හිඟ පළාත් සඳහා මෙන්ම පිරිසිදු පානීය ජල අවශ්‍යතා ඇති පුද්ගලයින්ට ද මෙම උල්පත් ජලය බෝතල් කර අලෙවි කළ හැකි බවටද සිහියට නැගුනි. වහාම ක්‍රියාත්මක වූ උපුල් පිරිසිදු කළ, පානීය ජලය බෝතල් කිරීම සම්බන්ධයෙන් තොරතුරු රැස් කර තම ඥාති සොහොයුරෙකුගෙන් ණයට ගත් රුපියල් 200,000 ක මුදල යොදවා තම බාල සොහොයුරන් දෙදෙනාද සමගින් සුළු පරිමාණයෙන් "නිසෝන්" යන නාමය යටතේ පිරිසිදු කළ පානීය ජලය බෝතල් කර අලෙවි කිරීම ආරම්භ කළේය. පාසලේ දී වාණිජ විෂය ධාරාව හදාරා තිබීමද විශ්ව විද්‍යාලය සඳහා ඇතුලත් කර ගැනීමට වසර දෙකක පමණ කාලයක් ගතවීමද මනා අවස්ථාවක් කර ගත් උපුල් තම සම්පූර්ණ කාලය, උත්සාහය, කැපවීම මතින් ඉතා කෙටි කලකදී මෙම ව්‍යාපාරය ප්‍රදේශයේ සාර්ථකම ව්‍යාපාරයක් බවට පත් කළේය. කලක් ඇවෑමෙන් වෙළඳපොලේ "නිසෝන්" බෝතල් කළ පානීය ජලය සඳහා හොඳ ප්‍රතිචාර මෙන්ම හොඳ ඉල්ලුමක් ද ඇති විය.

සිය නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වීමෙන් තව තවත් ධෛර්මත් වූ උපුල් මහජන බැංකුවෙන් ලබා ගත් රුපියල් 1,000,000 ණය මුදලද යොදවා ව්‍යාපාරය තවදුරටත් පුළුල් කළ අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් තම නිෂ්පාදන සඳහා SLS සහතිකයද ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඉලක්ක පාරිභෝගිකයින් මැනවින් හඳුනාගත් උපුල් ප්‍රමාණ කීපයකින් යුතු බෝතල් මගින් ඒ ඒ පාරිභෝගික කණ්ඩායම් උපරිමයෙන් තෘප්තිමත් වන පරිදි තම නිෂ්පාදන ඉහල තත්ත්වයකින් යුතුව වෙළඳපොලට ඉදිරිපත් කිරීමට සෑම කල්හිම උත්සුක විය.

තම විශ්ව විද්‍යාල අධ්‍යාපන කටයුතු වලට පමණක් නොව තම පවුලේ අනෙකුත් සාමාජිකයින්ගේද සුභසිද්ධිය උදෙසා නිරන්තරවම උපකාර කළ උපුල් ප්‍රදේශයේ පොදු සමාජීය කාරණාවලදීද නොමසුරුව උදවු කළේය. විශ්ව විද්‍යාල අධ්‍යාපන කටයුතු නිමා කරන විට දිවයිනේ සාර්ථකම ව්‍යාපාරිකයෙකු ලෙස සම්මාන කීපයක්ම ලබා ඇති උපුල්ගේ මීළඟ උත්සාහය වූයේ ජාත්‍යන්තරය ජය ගැනීමයි. මේ සඳහා තම ව්‍යාපාරය තවදුරටත් පුළුල් කර ගැනීමට නව ව්‍යාපාර සැලැස්මක් යටතේ ක්‍රියාත්මක වීමට උපුල් කටයුතු කළේය.

උපුල්ගේ ව්‍යාපාරයේ 1995 වසරට අදාල අපේක්ෂිත මුදල් ගලා ඒම් හා ගලා යාම් පහත පරිදි වේ.

| | |
|---|---|
| බැංකු ණය | රු. 5,000,000 |
| අපේක්ෂිත අලෙවි ආදායම | රු. 1,225,000 |
| ණයගැති ලැබීම් | රු. 225,000 |
| ප්ලාස්ටික් බෝතල් මිලට ගැනීම | රු. 160,000 |
| විදුලි බිල | රු. 62,000 |
| සේවක වැටුප් | රු. 236,000 |

(i) උපුල් ව්‍යවසායකයෙකු ලෙස ඔබ දකින්නේද?
(ii) උපුල් තුළ පවතීයැයි දැකිය හැකි ව්‍යවසායකත්ව ගතිලක්ෂණ දෙකක් දක්වන්න.
(iii) මෙම ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයෙහි දැකිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(iv) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද? ඔබගේ පිළිතුරට හේතුව සඳහන් කරන්න?
(v) පිරිසිදු කළ පානීය ජලය බෝතල් වල ඉලක්ක වෙළඳපොළ කවුරුන් ද?
(vi) මෙම ව්‍යාපාරය සඳහා බලපා ඇති බාහිර පාරිසරික සාධක දෙකක් නම් කරන්න.
(vii) මෙම ව්‍යාපාරයේ ඔබ දකින ශක්තියක් හා අවස්ථාවක් දක්වන්න?

www.edudept.uva.gov.lk

(viii) උපුල් තම ව්‍යාපාරයට ප්‍රාග්ධනය සපයාගත් ආකාර දෙකක් දක්වන්න.
(ix) උපුල්ගේ ව්‍යාපාරයට ජාත්‍යන්තර වෙළඳපොළට පිවිසීමේ දී භාවිතා කළ හැකි ප්‍රවර්ධන ක්‍රම දෙකක් දක්වන්න.
(x) මෙම ව්‍යාපාරයෙහි 1995 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරන්න.
(ල.02×10)

02. (i) ව්‍යවසායකයන් තුල පොදුවේ දක්නට ලැබෙන ගති ලක්ෂණ හතරක් නම් කරන්න.
(ii) පහත නිදසුන්වලට අදාලව නවෝත්පාදන සිදුවන ආකාර දක්වන්න
අ) විද්‍යුත් ගෙවීමේ ක්‍රම
ආ) දුරකථනය
(iii) මානව අවශ්‍යතා දෙකක් දක්වා ඒවා ඉටු කර ගැනීමට යොදාගනු ලබන වුවමනා දෙක බැගින් දක්වන්න.
(iv) ව්‍යාපාරයක දැකිය හැකි ගති ලක්ෂණ හතරක් ලියන්න.
(v) පහත ව්‍යවසායකයින් කුමන ව්‍යවසායකයන් වර්ගයට අයත් වේද?
අ) C.W.W. කන්නන්ගර මැතිතුමා
ආ) සිල්ලර වෙළෙඳ ව්‍යාපාරිකයා (ල.02×05)

03. (i) ව්‍යවසායකත්වයෙන් ලැබෙන ප්‍රතිලාභ ආකාර දෙකකි. එම ආකාර දෙක නම් කරන්න.
(ii) සමාජ සුභ සාධනය සඳහා ව්‍යවසායකයා යොමු වන ආකාරය දැක්වීමට උදාහරණ දෙකක් දක්වන්න.
(iii) කුඩා පරිමාණ ව්‍යාපාරයක දැකිය හැකි මූලික ලක්ෂණ හතරක් දක්වන්න.
(iv) කුඩා පරිමාණ ව්‍යාපාරයන් සාර්ථක කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.
(v) වව්‍යවසායකත්ව භූමිකා 02ක් දක්වා එම භූමිකාවට අයත් කාර්යය බැගින් දක්වන්න. (ල.02×05)

04. (i) අතීත ව්‍යාපාර පරිසර හා නූතන ව්‍යාපාර පරිසර අතර දැකිය හැකි වෙනස්කම් හතරක් දක්වන්න.
(ii) ශ්‍රී ලංකාවේ සුලභව පවතින සම්පත් වර්ග කළ හැකි ආකාරය දක්වා ඒ සඳහා උදාහරණය බැගින් දක්වන්න.
(iii) සීඝ්‍ර වෙනස්වීම් සමගින් පුළුල් වන ව්‍යාපාර ක්ෂේත්‍රයේ දැකිය හැකි නව ප්‍රවනතා දෙකක් දක්වන්න.
(iv) නව ව්‍යවසායකයකුට වෙළඳපොලට ප්‍රවේශවීම සඳහා අනුගමනය කළ හැකි විකල්ප ක්‍රම මොනවාද?
(v) පවතින ව්‍යාපාර අදහස් අතුරින් හොඳ ව්‍යාපාර අදහසක් තෝරා ගැනීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රියාවලියට අයත් පියවරයන් නම් කරන්න? (ල.02×05)

05. (i) "සැලසුම් කිරීමට අසමත් වන්නා අසමත් වීමට සැලසුම් කරන්නෙකි" ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාව තහවුරු කිරීමට කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.
(ii) ව්‍යාපාර සැලැස්මක අවශ්‍යයෙන්ම පැවතිය යුතු මූලිකාංග මොනවාද ?
(iii) වෙළඳපළ විශ්ලේෂණයකදී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් දක්වන්න.
(iv) ඉලක්ක පාරිභෝගිකයින් ලෙස හැඳින්වෙන්නේ කවුරුන්ද නිදසුන් සහිතව පහදන්න.
(vi) 4 $P^s$ නම් කරන්න. (ල.02×05)

06. (i) නිෂ්පාදන සැලැස්මක ඇතුලත් තොරතුරු දෙකක් ඉදිරිපත් කරන්න.
(ii) ඔබ කැමැති සේවාවක් උදාහරණයට ගෙන එහි නිෂ්පාදන ක්‍රියාවලිය දක්වන්න.
(iii) සනුකගේ බිම්මල් ව්‍යාපාරයේ 2014 වර්ෂයේ මුළු නිෂ්පාදන පිරිවැය රු. 60,000 ක් වූ අතර වර්ෂය තුළ නිෂ්පාදිත බිම්මල් පැකට් සංඛ්‍යාව 2,000 කි. සනුක පිරිවැය මත 20% ක ලාභාන්තිකයකට බිම්මල් පැකට් එකක් මිල ලකුණු කළේ නම් එක් පැකට් එකක මිල කීය ද ?
(iv) සංවිධාන සටහනක ඇතුලත් තොරතුරු දෙකක් දක්වන්න.
(v) ඇඟලුම් කර්මාන්ත ශාලාවක පැවතිය හැකි තනතුරු දෙකක් සඳහන් කරන්න. (ල.02×05)

07. (i) මූල්‍ය සැලැස්මක අන්තර්ගත කොටස් දෙකක් නම් කරන්න.
(ii) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ඇතිවන වියදම් දෙකක් නම් කරන්න.
(iii) ව්‍යාපාර සංවිධාන වර්ග හතරක් දක්වන්න.
(iv) ව්‍යවසායකයෙකු වීමට කාන්තාවන් තුළ ඇති ශක්තීන් දෙකක් දක්වන්න.
(v) ව්‍යාපාරයක සමාජ වගකීම් මට්ටම් දෙකක් දක්වන්න. (ල.02×05)



www.edudept.wp.gov.lk